හපුතලේ නගර සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජනවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 18 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 27 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දින හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාලව කර්මාන්ත 04 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.3,997,565 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (ii) | ඉකුත් වර්ෂයට අදාල මන්ත්‍රී දීමනා රු.147,200 ක් සහ අභ්‍යාසලාභී වැටුප රු.6,360 ක් ප්‍රතිපූර්ණය කළ නොහැකි බව පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් දන්වා තිබුණු බැවින්, එම වියදම සමුච්චිත අරමුදලට හර කර ණයගැතියන් බැර කළයුතු වුවද, විවිධ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

**(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.56,470,678 ක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය සත්‍යාපනය සඳහා අයිතිය තහවුරු කිරීමේ ලියවිලි හා වටිනාකම් සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

**1.4 අනුකූල නොවීම**
**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥාපනත | | | |
| 180(1) (2) වගන්ති | ලැබීම් හා ගෙවීම්, පිළිබඳව සවිස්තර වාර්තාවක් 2015 සිට 2019 දක්වා වර්ෂ වෙනුවෙන් ඉදිරිපත් කර නොතිබුණි. | නගර සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ 371 | විවිධ කාර්යයන් සඳහා අවස්ථා 12 කදී දෙන ලද රු. 140,480 ක අතුරු අග්‍රිම වසර 2 ක කාලයක් ඉක්මවා තිබුණද, පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,254,246 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,665,338 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,846,014 | 2,062,126 | 1,967,572 | 94,554 | 1,845,351 | 1,845,351 | 1,565,961 | 279,391 |
| (ii) | කුලී | 17,775,987 | 16,152,406 | 13,484,476 | 2,667,930 | 16,444,277 | 16,444,277 | 11,347,817 | 5,096,460 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 735,000 | 568,850 | 568,850 | - | 325,000 | 325,000 | 380,600 | (55,600) |
| (iv) | වෙනත් ආදායම් | 1,274,026 | 1,097,810 | 1,120,419 | (22,609) | 1,057,921 | 1,057,921 | 1,517,147 | (459,226) |
| | එකතුව | 21,631,027 | 19,881,192 | 17,141,317 | 2,739,875 | 19,672,549 | 19,672,549 | 14,811,525 | 4,861,025 |

**2.2.2** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ආදායම් ණය ගැතියෝ රු.14,092,761 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

**2.2.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.404,686 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.441,294 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගරසභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 25 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉන් කාරණා 24 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

(ඇ) <u>පරිසර බලපත්‍ර</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසරයට අපද්‍රව්‍ය හා ජලය මුදාහරින ආයතන වාර්ෂිකව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවද ව්‍යාපාර 29 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අදාල ආයතන සඳහා පරිසර බලපත්‍ර නිකුත් කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

### 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය අනුව වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කළ යුතු වුවද, නගර සභා බල ප්‍රදේශය තුල වරිපනම් අයවන දේපළ 2007 වර්ෂයෙන් පසුව තක්සේරු කිරීමකින් තොරව ගාස්තු අය කරමින් පැවතුනි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු රු.1,479,176 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

### 3.3 <u>ප්‍රසම්පාදනය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව සැපයුම් හා කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් නඩත්තු කාලය තුළ රැදවුම් මුදලක් තබා ගත යුතු වුවද, සභාව මගින් ක්‍රියාත්මක කල රු.393,598 ක් වූ කර්මාන්ත 4 ක් වෙනුවෙන් කිසිදු රැදවුම් මුදලක් තබා නොගෙන මුළු මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7 වගන්තිය අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක සාමාජිකයින් තිදෙනාගෙන් එක් සාමාජිකයෙකු බාහිර ආයතනයකින් සම්බන්ධ කරගත යුතු වුවද, අවස්ථා 06 කදී එසේ කර නොතිබුණි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය සමග එකඟ වෙමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | නිරීක්ෂණය සමග එකඟ වෙමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | නිරීක්ෂණය සමග එකඟ වෙමි. |